විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!

කලා - සංස්කෘතික අතිරේකය

2025 නොවැම්බර්

# සාහිත්‍ය මාසය, කියවන මාසය

## ගෙවී ගිය සැප්තැම්බරය හා ඔක්තෝබරය පිළිවෙළින්

සාහිත්‍ය මාසය සහ කියැවීමේ මාසය ලෙස අප සමාජය තුළ හඳුන්වනු ලබනවා. සැප්තැම්බරයේ පැවති පොත් සල්පිල සළකා බැලුවම අධික මිල ගණන් නිසා පොත් අතපත ගා සතුටුවීමට මිස ඒවා අත්පත් කරගෙන කියවන්නට අවස්ථාව අහිමි විශාල පිරිසක් දකින්න ලැබුණා. තමන් රුචි කරන කෘති දෙස බලමින් ඒවා හිමිකර ගැනීමට මුදලක් නොමැති නිසා සුසුම්ලමින් පිටව යන පිරිස පසුගිය වසරට වැඩියෙන් සිටි බව දක්නට ලැබුණා. නමුත් පොත් අලෙවිය ගැන ප්‍රකාශකයන් කිව්වෙ පසුගිය වසරට වඩා වැඩි අලෙවියක් තිබුණු බවයි.

අප මෙහි කතා කරන්නෙ පොත් ප්‍රකාශයට පත් විය යුත්තේ ඒවා කියවන්න, තමන්ගෙ කරගන්න කැමති අය වෙනුවෙන්. ඉන් සමහරු නිශ්චිතව පොතක් තමන් සතුව තිබීමෙන් තෘප්තිමත් වෙන්න මිස එය කියවා බැරෑරුම් අදහසක් ගන්න සූදානම් නැති වෙන්නත් පුළුවන්. නමුත් පොදුවෙ පොතකට ආශක්ත වීමේ සිට පොත හුවමාරු කරගෙන කියවන රසික සහෘදභාවයේ සිට පොත් පිටු මත සටහන් තබමින් ඉරි ගසමින් අධ්‍යයනය කරන ඒ ගැන විවාද කරන ශාස්ත්‍රවන්තයන් දක්වාම පොත්ගුල්ලන් ලෙස හැඳින්වීමේ හැකියාවක් තිබෙනවා.





## ඉතින් ඊට පස්සෙ ?

පොත් කර්මාන්තයක් ලෙස ගත්තම මේ පොත්ගුල්ලන් පාරිභෝගිකයන් ලෙස සැළකෙනවා. පරිභෝජනය කරන්න ඇති හැකියාව මුදල් මත තීරණය වන පසුබිමක මුද්‍රණ කර්මාන්තය, ප්‍රකාශන ව්‍යාපාර ක්ෂේත්‍රය ආදිය පමණක් නෙවෙයි, කඩදාසි සහ තීන්ත වෙළෙඳපොළ ඇතුළු විශාල කලාපයක් ගැන කතා බහ කරන්න වෙනවා.

විශේෂයෙන්ම රටක් ලෙස අප ගමන් කරමින් ඉන්න ආර්ථික අර්බුදය තුළ පවා පොත් මිල නිසා ඇතිව තිබෙන සමාජ සංස්කෘතික අවපාතය ගැන කෙරෙන කතාබහක් පසුගිය කාලෙ තිබුණා. ඒ වගේම මැතිවරණ වේදිකාවලදි මේ ගැන කනගාටුව පළ කරමින් පොත්වල මිල පහත දැමීම වෙනුවෙන් මුද්‍රණ කඩදාසි ඇතුළු මුද්‍රණ කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය මත පනවා ඇති බදු පහත හෙළීම මැතිවරණ පොරොන්දු බවටත් පත් වුණා. ඒ විතරක් නෙවෙයි, පාසල් දරුවන්ගෙ ඉගෙනුම් උපකරණ මත බදු පහත හෙළීමේ පොරොන්දු පවා තිබුණා.

නමුත් 2025 වසර ගෙවී යද්දි, විශේෂයෙන්ම 'පොත් වසන්තය' කියලා වෙළෙන්දන්ට පමණක් කියන්න පුළුවන් මාසයකුත් 'කියවන මාසය' කියලා දේශපාලන වේදිකාවල දුන් පොරොන්දු කඩ කළ බේගල් දේශපාලකයන්ට පමණක් කියන්න පුළුවන් කාලයකුත් ගෙවී ගිහින් තිබෙනවා. මතකයට එකතුවන කාරණයක් ලෙස ජාතික ජනබලවේගයේ මැතිවරණ ප්‍රකාශයේ 37වැනි පිටුවෙ තියෙනවා, සංස්කෘතික මිනිසෙක් ගැන කතාවක්.




අපි ගෙවමින් ඉන්නෙ ජාතික ජනබලවේගයේ දෙවැනි වසරට අයිති කාලසීමාවක්. දෙවැනිවරට මේ ආණ්ඩුව 2026 අයවැය ඉදිරිපත් කරද්දි හෝ පොත් මිල අවම කරගන්න මුද්‍රණ හා ප්‍රකාශන කර්මාන්තයට වාසිදායක ඒ නිසාම පොත් කියවන සහෘදයන්ට, පාසල් දරුවන්ට වාසිදායක ඉදිරි වසරක් උදා වෙයිද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. එහෙත් ඒ වෙනුවෙන් බලා නොඉඳ සංස්කෘතික මිනිසුන්ගේ අරමුණු වෙනුවෙන් ආණ්ඩුවට බලපෑම් කළ යුතු බවත් අප කල්පනා කරනවා.

---




'මේස' කලා සංස්කෘතික දිගහැරුම ගාල්ල දිස්ත්‍රික්කයේ පවත්වා ගෙන ආ කලා සංස්කෘතික කටයුතුවල කූටප්‍රාප්තියක් ලෙස නොවැම්බර් 22 සහ 23 දිනවල ගාල්ල, හෝල් ඩි ගෝල් පරිශ්‍රයේ පැවැත්වෙන කලා සංස්කෘතික කටයුතු පිළිබඳ කාලසටහන මෙසේය.

### නොවැම්බර් 22

පෙ.ව. 10.00 - 12.00 සංගීත සංවාදය

ප.ව. 1.00 - 3.00 'හංස විලක්' සිනමා සංවාදය

ප.ව. 3.30 - 5.30 සොකරි කෝලම්

ප.ව. 6.00 - 9.00 නාට්‍ය දර්ශනය

### නොවැම්බර් 23

පෙ.ව. 10.00 - ප.ව.12.00 පොත සංවාදය

ප.ව. 12.30 - 1.30 කවි කියවීම

ප.ව. 2.00 - 3.30 වාද බයිලා

ප.ව. 4.00 - 6.00 ත්‍යාග ප්‍රදානෝත්සවය

ප.ව. 7.00 - 10.00 සංගීත කණ්ඩායම් සන්ධ්‍යාව